# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය

**සුළු හිමිකම් අධිකරණවල දී අනුගමනය කරනු ලැබීමට නියමිත කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 31 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[143 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 36.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය

එල්.ඩී.—ඕ. 44/2021

**සුළු හිමිකම් අධිකරණවල දී අනුගමනය කරනු ලැබීමට නියමිත කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** (1) මේ පනත 2022 අංක            දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## නඩු

නඩු පැවරීම

**2.** මේ පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට සහ අධිකරණ සංවිධාන පනතේ Vඅ වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පනවනු ලබන යම් මූල්‍යමය හෝ වෙනත් සීමාකිරීම්වලට යටත්ව, සිවිල් නඩු විධාන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සුළු හිමිකම්පෑමක් සඳහා වූ යම් නඩුකරයක් අධිකරණ කොට්ඨාසයේ ප්‍රාදේශීය සීමාව තුළ පවතින සුළු හිමිකම් අධිකරණයේ පවරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නඩු නිමිත්තේ වටිනාකම නිශ්චිතව දක්වන ලද මුදලට හෝ අධිකරණ සංවිධාන පනතේ 29අ වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන වෙනත් යම් මුදලකට වඩා අඩු වුව ද, මුදල් අයකර ගැනීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ LIII වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ විශේෂ විධිවිධාන යටතේ ගොනුකරන ලද යම් නඩුවක් විභාග කර තීරණය කිරීම සඳහා සුළු හිමිකම් අධිකරණයක් වෙත අධිකරණ බලයක් නොතිබිය යුත්තේ ය.

**සුළු හිමිකම් අධිකරණයක නඩු නිමිති**

**3.** සුළු හිමිකම් අධිකරණයක යම් නඩු නිමිත්තක් නිශ්චිතව දක්වා ඇති යම් මුදලක් සම්බන්ධයෙන් වූ අධිකරණ සංවිධාන පනතේ Vඅ වන පරිච්ඡේදයේ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති මුදලට හෝ අධිකරණ සංවිධාන පනතේ 29අ වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන වෙනත් යම් මුදලකට සීමා විය යුතු යඃ

එසේ වුව ද, එක් එක් නඩු නිමිත්තේ වටිනාකම එම මුදල නොඉක්මවන අවස්ථාවක දී, පැමිණිලිකරු විසින් එකම පාර්ශ්ව අතර පවතින එකම ක්‍රියාවක් හෝ ගනුදෙනුවක් තුළින් උපචිත වන නඩු නිමිති දෙකක් හෝ වැඩි ගණනක් එක් කරනු ලැබිය හැකි ය.

**හිමිකමක කොටස් අතහැරීම**

**4.** සුළු හිමිකම් අධිකරණයක අධිකරණ බලය අයැදීමේ අරමුණින් යුතුව හිමිකමක හෝ හිමිකම්වල කොටසක් අත්හැර දැමීම හෝ බැහැර කිරීම සඳහා පැමිණිලිකරුවකුට අයිතියක් ඇති අතර පැමිණිල්ලේ එම කාර්ය සඳහා ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

**වැරදි අධිකරණයෙහි පැමිණිල්ල ඉදිරිපත් කරන ලද අවස්ථාවක**

**5.** අධිකරණ සංවිධාන පනතේ Vඅ වන පරිච්ඡේදය ප්‍රකාරව අධිකරණ බලය නොමැති යම් දිසා අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක නඩුවක් ගොනු කරනු ලැබ ඇති සෑම අවස්ථාවක දී ම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 47 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 47 වන වගන්තිය ප්‍රකාරව පැමිණිල්ල ආපසු දී ඇති අවස්ථාවක දී, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කාලාවරෝධ වීමේ කාලසීමාව ගණනය කිරීමේ දී, නඩුව පැවරීමේ දිනය හා පැමිණිල්ල ආපසු දීමේ දිනය අතර කාලසීමාව බැහැර කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## උත්තරවාද සහ සිතාසි

**උත්තරවාද**

**6.** සුළු හිමිකම් අධිකරණයක උත්තරවාද-

(අ) පැමිණිල්ලට;

(ආ) උත්තරයට; සහ

(ඇ) ප්‍රතිඋත්තරයට,

සීමා විය යුතු යඃ

එසේ වුව ද, කිසිදු හරස් ඉල්ලීමක් නොමැති අවස්ථාවක දී, උත්තර ප්‍රකාශයෙන් ඔබ්බට තවදුරටත් වූ උත්තරවාද නොතිබිය යුතු ය.

**පැමිණිල්ල ඉදිරිපත් කිරීම**

**7.** (1) නඩුව විභාග කර තීරණය කිරීම සඳහා අධිකරණ බලය ඇත්තා වූ උචිත සුළු හිමිකම් අධිකරණය වෙත මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අංක 1 ආකෘතියෙන් යථා පරිදි මුද්දර අලවන ලද ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම මගින් පැමිණිලිකරු විසින් හෝ තමා වෙනුවෙන් ස්වකීය ලියාපදිංචි නීතිඥවරයා මගින් සුළු හිමිකම් අධිකරණයක සෑම නඩුවක් ම පවරනු ලැබිය යුතු ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 40 වන වගන්තියේ විධිවිධාන මගින් සඳහන් කිරීමට නියමිත විස්තර පැමිණිල්ලේ ඇතුළත්විය යුතු අතර සිවිල් නඩු විධාන සංග්‍රහයේ 46 වන වගන්තියේ විධිවිධාන සුළු හිමිකම් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන එම පැමිණිල්ල සඳහා අදාළ විය යුතු ය.

**පැමිණිල්ලට දිවුරුම් ප්‍රකාශය සහ ඉදිරිපත් කිරීම් අමුණා තිබිය යුතු බව**

**8.** පැමිණිලිකරු විසින්, පැමිණිල්ල ඉදිරිපත් කිරීමේ දී, එහි සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශ ගොනු කරනු ලැබිය යුතු අතර, පැමිණිල්ල පදනම් වන කරුණු තහවුරු කිරීම සඳහා තමාගේ සන්තකයේ හෝ බලය යටතේ පවතින යම් සාධන පත්‍ර, ගිවිසුම්, එකඟවීම්, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, චෙක්පත් හෝ නඩු පැවරීමේ ලේඛන සහ ඔහු විසින් උපකාර පතනු ලබන වෙනත් සියලු ලේඛනමය සාක්ෂි ඇත්නම් ඒවා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**සිතාසි නිකුත් කිරීම සහ භාරදීම**

**9.** (1) පැමිණිල්ල පිළිගැනීමට පෙරාතුව, සුළු හිමිකම් අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, යම් හේතුවක් නිසා එම පැමිණිල්ල විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කර එම පැමිණිල්ල මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 46 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි සංශෝධන සඳහා ආපසු හරවා යැවීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

(2) එවැනි පැමිණිල්ලක් පිළිගැනීමෙන් පසුව, මෙහි උපලේඛනයේ අංක 2 ආකෘතියෙන් සුළු හිමිකම් අධිකරණය විසින් සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) සිවිල් නඩු විධාන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ විධිවිධාන මේ කොටසේ විධිවිධාන සමඟ අනනුකූල නොවනතාක් දුරට එම විධිවිධාන සුළු හිමිකම් අධිකරණයේ සිතාසි නිකුත් කිරීම, භාරදීම, ආපසු හරවා යැවීම සහ භාරදීම තහවුරු කිරීම් සම්බන්ධයෙන් හෝ ක්‍රියාවලි සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**විත්තිකරු විසින් පැමිණිලිකරුගේ හිමිකම්පෑම පිළිගනී නම්, විත්තිකරුට එරෙහිව නඩු තීන්දුව**

**10.** සිතාසි ආපසු ලැබිය යුතු දිනයේ දී විත්තිකරු පැමිණ සිටින අවස්ථාවක දී, නියමයන් සහිතව හෝ රහිතව විත්තිකරු විසින් පැමිණිල්ල පිළිගැනීමට සූදානම් ද නැද්ද යන්න විනිශ්චයකාරවරයා විසින් විමසිය යුතු අතර, විත්තිකරු විසින් පැමිණිලිකරුගේ හිමිකම්පෑම පිළිගනී නම්, සුළු හිමිකම් අධිකරණය විසින් එම කරුණ වාර්තාගත කර එසේ සිදු කරන ලද පිළිගැනීමට අනුව විත්තිකරුට එරෙහිව නඩු තීන්දුවක් ඇතුළත් කරනු ලැබිය යුතු ය. එම පිළිගැනීම විත්තිකරු විසින් අත්සන් කර ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර ඔහුගේ අත්සන නීතිඥවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

**උත්තරය සහ උත්තරයෙහි ඇතුළත් විය යුතු කරුණු**

**11.** (1) විත්තිකරු විසින්, පැමිණිලිකරුගේ හිමිකම්පෑම පිළිගනු නොලැබුවහොත්, විත්තිකරු විසින් ම හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ ලියාපදිංචි නීතිඥවරයා විසින් ස්වකීය උත්තරය සහ පැමිණිලිකරුට එරෙහිව තිබිය හැකි හරස් ඉල්ලීම නිශ්චිතව දක්වමින් විත්තිකරු හෝ ඔහුගේ නීතිඥවරයා විසින් අත්සන් කරන ලද යථා පරිදි මුද්දර අලවන ලද ලිඛිත උත්තරයක් සුළු හිමිකම් අධිකරණය වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(2) උත්තරයේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 75 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රකාශ කිරීමට නියමිත විස්තර අන්තර්ගත විය යුතු අතර සිවිල් නඩු විධාන සංග්‍රහයේ 76 සිට 78 දක්වා වූ වගන්තිවල සඳහන් විධිවිධාන උත්තරය සඳහා අදාළ විය යුතු අතර, උත්තරය මෙහි උපලේඛනයේ අංක 3 ආකෘතියෙන් විය යුතු ය.

(3) විත්තිකරු තමා විසින් ම හෝ නීතිඥවරයකු මගින් පෙනී සිටීමේ දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත උත්තරය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පැමිණිලිකරු හෝ එක් එක් පැමිණිලිකරුවන් වෙත දැනුම් දීමෙන් පසුව රෙජිස්ට්‍රාර් කාර්යාලයේ උත්තරය ගොනු කිරීම සඳහා උචිත අවස්ථානුගත

කරුණු යටතේ සුළු හිමිකම් අධිකරණය විසින් කාලයක් ප්‍රදානය කර ඇත්නම් මිස, උත්තරය ඉදිරිපත් කිරීම සඳහා සුළු හිමිකම් අධිකරණය විසින් තවදුරටත් වූ කාලසීමාවක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

දිවුරුම් ප්‍රකාශය සහ ප්‍රදර්ශක උත්තරය සමඟ අමුණා තිබිය යුතු බව

**12.** විත්තිකරු විසින්, උත්තරය ඉදිරිපත් කිරීමේ දී, උත්තරය හෝ හරස් ඉල්ලීමේ සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශ ගොනු කරනු ලැබිය යුතු අතර, විත්තිවාචකය තහවුරු කිරීම සඳහා හෝ හරස් ඉල්ලීමේ පදනම් වූ කරුණු තහවුරු කිරීම සඳහා තමාගේ සන්තකයේ හෝ බලය යටතේ පවතින සියලු ලේඛන හෝ ඔහු විසින් උපකාර පතනු ලබන වෙනත් සියලු ලේඛනමය සාක්ෂි විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රතිඋත්තරය

**13.** (1) හරස් ඉල්ලීමක් පවතින අවස්ථාවක දී, දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශ සහ පවතින්නේ නම් ලේඛන සමඟ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ප්‍රතිඋත්තරයක් ගොනු කිරීම සඳහා අවසර ලබා දිය හැකි අතර, ලිඛිත උත්තරයකට අදාළ රීති පැමිණිලිකරු විසින් ගොනු කරනු ලබන ප්‍රතිඋත්තරය සඳහා ද අදාළ විය යුතු ය.

(2) පැමිණිලිකරු විසින් හරස් ඉල්ලීම පිළිගනී නම්, එම පිළිගැනීම සුළු හිමිකම් අධිකරණය විසින් වාර්තාගත කර එය අත්සන් කරන ලෙස පැමිණිලිකරුට නියම කරනු ලැබිය යුතු ය. එසේ සිදු කරනු ලබන පිළිගැනීම්වලට අනුව එවැනි හරස් ඉල්ලීමක් සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව සුළු හිමිකම් අධිකරණය විසින් නඩු තීන්දුවක් ඇතුළත් කරනු ලැබිය හැකි ය. එවැනි පිළිගැනීමක් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර පැමිණිලිකරු විසින් අත්සන් කර ඔහුගේ අත්සන නීතීඥවරයකු මගින් සහතික කරනු ලැබිය යුතු ය.

හරස් ඉල්ලීම සුළු හිමිකම් අධිකරණයේ මූල්‍යමය අධිකරණ බලය ඉක්මවා පැවතීම

**14.** හරස් ඉල්ලීම, සුළු හිමිකම් අධිකරණයේ මූල්‍යමය අධිකරණ බලය ඉක්මවනු ලබන අවස්ථාවක දී, එහි සඳහන් හිමිකම් මුදල සුළු හිමිකම් අධිකරණයේ මූල්‍යමය අධිකරණ බලය ඉක්මවා ගිය ද එය නොසලකා හරිමින්, බහුවිධ නඩුකර වැළැක්වීම සඳහා, සුළු හිමිකම් අධිකරණය විසින් නීතියට අනුව එම හරස් ඉල්ලීම විභාග කර තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන සමඟ උත්තරය සහ ප්‍රතිඋත්තරය භාරදිය යුතු බව

**15.** උත්තරය සහ ප්‍රතිඋත්තරය සමඟ අමුණා ඇති සියලු දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන, උත්තරය හෝ ප්‍රතිඋත්තරත් සමඟ විරුද්ධ පාර්ශ්වය හෝ පාර්ශ්ව වෙත භාරදෙනු ලැබිය යුතු ය. සුළු හිමිකම් අධිකරණය විසින් ස්වකීය පරම අභිමතය පරිදි, පැහැරහැරීමේ පාර්ශ්වය මත නඩු ගාස්තු පනවනු ලැබිය හැකි ය.

අයැදීම් සංශෝධනය කිරීම

**16.** යම් අයැදීමක් සංශෝධනය කිරීම සඳහා වන යම් ඉල්ලීමකට අධිකරණය අවසර ලබා නොදුනහොත් බරපතල සහ පිළියම් යෙදිය නොහැකි අසාධාරණයක් වන බවට සහ එම ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය ප්‍රමාදයට වරදකරුවකු නොවන බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් සහ එසේ සෑහීමට පත්වීමට හේතු වූ කරුණු වාර්තාගත කිරීමෙන් හැර කිසිදු වෙනත් හේතුවක් මත වන කිසිදු ඉල්ලීමකට අධිකරණය අවසර ලබා දෙනු නොලැබිය යුතු යඃ

එසේ වුව ද, අධිකරණය විසින් ඕනෑ ම අවස්ථාවක දී යම් පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව අයැදීමක වන ලිපිකරු හෝ අංකමය දෝෂ නිවැරදි කිරීම සඳහා අයැදීමක් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

III වන කොටස

**ලේඛනමය සාක්ෂි**

යම් නඩුවක පාර්ශ්වයක් විසින් අධිකාරයන් සඳහා, වාර්තා, සහතික පිටපත් සහ ලේඛන සොයාගැනීම පිළිබඳ ඉල්ලා සිටීම

**17.** (1) පහත සඳහන් කරුණු සඳහා නඩුවේ යම් පාර්ශ්වයක් විසින් අනෙක් සියලු පාර්ශ්ව වෙත දැනුම්දීමක් සහිතව 22 වන වගන්තිය ප්‍රකාරව සමථයකට පත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී හෝ එදිනට පෙරාතුව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එනම්-

(අ) අධිකාරයන් නිකුත් කිරීම;

(ආ) කරුණු පිළිබඳ විශේෂ සහ ස්වාධීන දැනීමක් ඇති තැනැත්තන්ගෙන් වාර්තා කැඳවීම;

(ඇ) යම් පාර්ශ්වයක සන්තකයේ හෝ බලය යටතේ පවතින ලේඛන අනාවරණය කිරීම, ඉදිරිපත් කිරීම, පරීක්ෂා කිරීම හෝ ලේඛනවල නිර්ව්‍යාජතාවය පිළිබඳව පිළිගැනීම සඳහා නියෝගයක් නිකුත් කර ගැනීම;

(ඈ) යම් රාජ්‍ය නිලධරයකුගේ, රාජ්‍ය සංස්ථාවක, පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක, බැංකුවක, මණ්ඩලයක, සංස්ථාවක හෝ සංස්ථාගත නොකළ ආයතනයක, හවුල් ව්‍යාපාරයක, රෝහලක, වෛද්‍ය ආයතනයක, අධිකරණයක, විනිශ්චය සභාවක හෝ වෙනත් එයට සමාන ආයතනයක සන්තකයේ පවතින ලේඛනවල සහතික පිටපත් නිකුත් කරන ලෙස නියෝගයක් නිකුත් කර ගැනීම; හෝ

(ඉ) පාර්ශ්වකරුවන් විවිධ මත දැරීමේ දී යම් කරුණක් පිළිබඳව ඔහු විසින් සුදුසු හෝ යෝග්‍ය යයි සිතන පරිදි යම් තුන්වන පාර්ශ්වයක සන්තකයේ පවතින ලේඛන අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් වෙනත් යම් උචිත ආඥාවක් නිකුත් කර ගැනීම සඳහා.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් ලබාගෙන ඇත්තා වූ පාර්ශ්වය විසින් එම ආඥාවේ දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත පියවර ගනු ලැබිය යුතු අතර, එම පාර්ශ්වය විසින් එසේ පියවර ගැනීමට අපොහොසත්වන අවස්ථාවක දී, සුළු හිමිකම් අධිකරණය විසින්, එම පැහැර හැරීම පිළිබඳව නොසලකා හරිමින් සහ නඩු ගාස්තුවලට යටත්ව, තවදුරටත් නඩු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

ලේඛනවල නිර්ව්‍යාජත්වය අනාවරණය කර ගැනීම, ඉදිරිපත් කිරීම, අධීක්ෂණය, ආරක්ෂාව හෝ පිළිගැනීම

**18.** (1) 17 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව, සිවිල් නඩු විධාන සංග්‍රහයේ XVI වන සහ XXIX වන පරිච්ඡේදවල සඳහන් විධිවිධාන යම් ලේඛනයක නිර්ව්‍යාජත්වය අනාවරණය කර ගැනීම, ඉදිරිපත් කිරීම, අධීක්ෂණය, ආරක්ෂාව හෝ පිළිගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකුල නොවන තාක් දුරට සුළු හිමිකම් අධිකරණය විසින් නිකුත් කරනු ලබන අධිකාරයක් සඳහා අදාළ විය යුතු ය.

විචාරණ

**19.** සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 සිට 100 දක්වා වූ වගන්තිවල (එම වගන්ති දෙක ද ඇතුළුව) සඳහන් විධිවිධාන සුළු හිමිකම් අධිකරණයේ නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**20.** සුළු හිමිකම් අධිකරණය විසින් තමාගේම අභිමතය පරිදි හෝ යම් පාර්ශ්වයක ඉල්ලීම පරිදි, පාර්ශ්වකරුවන් විවිධ මත දරනු ලබන කරුණු පිළිබඳව නඩු කටයුතු සිදු කරන අතරතුර දී අනාවරණය කරගනු ලබන එහෙත් පැමිණිල්ල හෝ උත්තරය හෝ ප්‍රතිඋත්තරය සමඟ අමුණා නොමැති ලේඛන, දිවුරුම් ප්‍රකාශයක් ද සමඟ ඉදිරිපත් කිරීම සඳහා අවසර ලබාදිය හැකි ය.

නඩු කටයුතුවල දී අනාවරණය කරගනු ලබන ලේඛන, දිවුරුම් ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු බව

**21.** (1) සුළු හිමිකම් අධිකරණය විසින් උත්තරය හෝ ප්‍රතිඋත්තරය ගොනුකිරීමෙන් පසුව වහාම, අයැදීම් සම්පූර්ණ කිරීමේ දිනයේ සිට සති හතරක කාලසීමාවක් ඇතුළත සමථයට පත්වීම සඳහා දිනයක් නියම කරනු ලැබිය යුතු අතර නඩු විභාගය සඳහා නඩුව ඉදිරිපත් කර ඇත්තේ යම් සුළු හිමිකම් අධිකරණයක් ඉදිරිපිට ද, එම සුළු හිමිකම් අධිකරණය විසින් ආරවුල සමථයකට පත්කිරීම සඳහා එළඹෙන ලෙස පාර්ශ්වකරුවන් උනන්දු කරවීම එම අධිකරණයේ කාර්යය විය යුතු අතර එවැනි සමථයක් ඇත්නම් එම සමථය වාර්තා කර ඒ අනුව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය. ප්‍රමාණවත් හේතුවක් නොමැතිව සමථය සඳහා නඩුව විභාගයට නියම කරනු ලබන දිනයේ පුද්ගල වශයෙන් පැමිණීමට යම් පාර්ශ්වකරුවකු අපොහොසත් වුවහොත්, එම දිනයේ දී පාර්ශ්වකරුවන් විසින් සමථයකට එළඹේ නම් මිස, එම පැහැර හැරීමේ පාර්ශ්වය හෝ පාර්ශ්වයන්ට එරෙහිව සුළු හිමිකම් අධිකරණය විසින් නඩු ගාස්තු අය කර ගැනීමේ ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

සමථයට පත්කිරීම

(2) පාර්ශ්වකරුවන්ගේ එකඟත්වය ඇතිව යම් උචිත නඩුවක දී අවසාන නඩු තීන්දුව වාචික සාක්ෂිවලින් තොරව පාර්ශ්ව විසින් අමුණා ඇති අයැදීම්, දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන මත පරම වශයෙන් ප්‍රකාශයට පත්කළ යුතු බවට සුළු හිමිකම් අධිකරණයේ අදහස වන අවස්ථාවක දී, සියලු පාර්ශ්ව විසින් සිදු කරනු ලබන කරුණු ඉදිරිපත් කිරීම් විභාග කිරීමෙන් පසුව, ඒ අනුව සුළු හිමිකම් අධිකරණය විසින් නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය. එසේ නොමැති නම්, සුළු හිමිකම් අධිකරණය විසින් නඩුව විභාගය සඳහා නියම කරනු ලැබිය හැකි ය.

**22.** (1) පාර්ශ්වකරුවන් අතර නඩුව සමථයට පත්කළ නොහැකි නම්, සුළු හිමිකම් අධිකරණය විසින්, එම කරුණ විභාගය සඳහා නියම කරනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවනතාක් දුරට එම විධිවිධාන එම නඩු විභාගය සඳහා අදාළ විය යුතු ය.

සමථ කිරීමක් නොමැති නම්, නඩුව විභාගය සඳහා නියම කළ යුතු බව

(2) පූර්ව නඩු විභාගයට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ XVIIඅ වන පරිච්ඡේදයේ විධිවිධාන සුළු හිමිකම් අධිකරණයේ නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

IV වන කොටස

**නඩු විභාගය**

නඩු විභාගය

**23.** (1) නඩු විභාග දිනයේ දී, සුළු හිමිකම් අධිකරණය විසින් පාර්ශ්වකරුවන් අතර වූ හිමිකම් පෑම්, පිළිගැනීම්, ඉදිරිපත් කිරීම් වාර්තාගත කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, මේ නඩු කටයුතුවල කාර්ය සඳහා, පාර්ශ්වකරුවන්ගේ විසඳිය යුතු ප්‍රශ්න වාර්තාගත කිරීම විධානාත්මක නොවිය යුතු අතර සුළු හිමිකම් අධිකරණය විසින් මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ආරවුල විභාග කර විනිශ්චය කිරීම සඳහා ඉදිරියට ක්‍රියා කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, යෙදී ඇති විශේෂිත කරුණු සම්බන්ධයෙන් විසඳිය යුතු ප්‍රශ්න වාර්තාගත කරනු ලැබිය යුතු බවට සුළු හිමිකම් අධිකරණයේ අදහස වන අවස්ථාවක දී, සුළු හිමිකම් අධිකරණය විසින් ස්වකීය අදහස අනුව උත්තරවාද, දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන තුළින් උපචිත වන එවැනි විසඳිය යුතු ප්‍රශ්න ඇත්නම්, එම විසඳිය යුතු ප්‍රශ්න වාර්තාගත කිරීම පවත්වාගෙන ගොස් නඩු විභාගය සිදුකරනු ලැබිය යුතු ය.

(2) උත්තරවාද සමග පාර්ශ්වකරුවන් විසින් ගොනුකරනු ලබන දිවුරුම් ප්‍රකාශ සහ සුළු හිමිකම් අධිකරණයේ අවසරය සහිතව ගොනුකරනු ලබන අතිරේක දිවුරුම් ප්‍රකාශ පිළිවෙළින් පාර්ශ්වයේ හෝ පාර්ශ්වවල මූලික සාක්ෂිය වශයෙන් සලකනු ලැබිය යුතු ය. එසේ වුව ද, පහත සඳහන් අවස්ථාවක දී පමණක් නඩු තීන්දුවක් ප්‍රකාශයට පත්කිරීම සඳහා හැකියාව ලැබෙන පරිදි යම් අතිරේක සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය බවට සුළු හිමිකම් අධිකරණය සලකනු ලබයි නම්, සුළු හිමිකම් අධිකරණය විසින් පාර්ශ්වකරුවන් වෙත වාචික හෝ ලේඛනමය වශයෙන් වූ අතිරේක සාක්ෂි මෙහෙයවීමට අවසර ලබාදිය හැකි ය. එනම්-

(අ) යම් අතිරේක සාක්ෂියක් හබකර සිටින කරුණු තීරණය කිරීම සඳහා අදාළ වීම;

(ආ) සාධාරණ උද්‍යෝගයක් සහ හොඳම උත්සාහයක් සහිතව පළමු අවස්ථාවේ දී උත්තරවාද සමඟ අතිරේක සාක්ෂි ලබා ගැනීමට නොහැකිව සහ අත්කර ගැනීමට නොහැකිව තිබිය හැකි වීම සහ එසේ සාක්ෂි ඉදිරිපත් නොවීම එම පාර්ශ්වයේ පාලනයෙන් පරිබාහිරව පැවත තිබීම;

(ඇ) මෙහෙයවීමට නියමිත යම් අතිරේක සාක්ෂියක් ලේඛනමය සාක්ෂියක් වේ නම්, ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය විසින් එවැනි ලේඛනමය සාක්ෂියේ නිර්ව්‍යාජත්වය බිඳහෙළීමට ලක්කරනු ලබන එවැනි ලේඛනයක් ඔප්පු කිරීමේ අවශ්‍යතාවයක් පැවතීම; සහ

(ඈ) දිවුරුම් ප්‍රකාශයක් මාර්ගයෙන් තහවුරු කිරීමට අපොහොසත් වන යම් නිල සාක්ෂිකරුවකුගේ හෝ වෙනත් යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂියක් මෙහෙයවීමට අවශ්‍යව පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනුව පාර්ශ්වකරුවන් විසින් එම සාක්ෂිකරු සම්බන්ධයෙන් සිතාසි යොමු කරනු ලැබිය යුතු වීම.

පාර්ශ්වකරුවන් විවිධ මත දැරීමේ දී සුළු හිමිකම් අධිකරණය විසින් යම් සාක්ෂිකරුවකුට සිතාසි නිකුත් කළ හැකි බව හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට නියම කරනු ලැබිය හැකි බව

**24.** (1) සුළු හිමිකම් අධිකරණය විසින් යුක්තියේ යහපත පිණිස, යම් පාර්ශ්වයක් විසින් සිදුකරන ඉල්ලීමක් මත, උත්තරවාදවල සඳහන් කර නොමැති වෙනත් යම් සාක්ෂිකරුවකු හෝ සාක්ෂිකරුවන් කැඳවීම සඳහා හෝ උත්තරවාද සමඟ අමුණා නොමැති යම් ලේඛන ඉදිරිපත් කිරීම සඳහා අවසර ලබා දිය හැකි ය. තව ද, අවශ්‍ය බවට පෙනී යන අවස්ථාවල දී, අධිකාරයක් මාර්ගයෙන් සොයාගන්නා ලද හෝ අනාවරණය කරගනු ලබන යම් ලේඛන මත තවදුරටත් වූ සාක්ෂි මෙහෙයවීම සඳහා සුළු හිමිකම් අධිකරණය විසින් පාර්ශ්වකරුවන් වෙත අවසර ලබා දිය හැකි ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රයේ 121 වන සහ 175 වන වගන්තිවල විධිවිධාන සුළු හිමිකම් අධිකරණයේ නඩු කටයුතු සඳහා අදාළ නොවිය යුතු ය.

(3) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 151අ වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට අවශ්‍ය වෙනස්කම් සහිතව යම් දිවුරුම් ප්‍රකාශයක් මත යම් සාක්ෂිකරුවකු පරීක්ෂා කිරීමක්, හරස් ප්‍රශ්න ඇසීමක්, නැවත ප්‍රශ්න

කිරීමක් සම්බන්ධ යම් සාක්ෂිකරුවකු පරීක්ෂා කිරීම සඳහා සහ එවැනි වෙනත් දිව්රුම් ප්‍රකාශයක් සමඟ අමුණා ඇති ලේඛනයක ආවේශ්‍ය බව සහ විශ්වසනීයත්වය පරීක්ෂා කිරීම සඳහා අදාළ විය යුතු ය.

**දෝෂාභියෝගයට ලක් නොකරන්නේ නම්, ලේඛන ඔප්පු කිරීම අනවශ්‍ය බව**

**25.** (1) නීතියට අනුව එහි සඳහන් වලංගු හේතු සමඟ යම් ලේඛනයක නිර්ව්‍යාජත්වය පිළිබඳව විරුද්ධ පාර්ශ්වය විසින් දෝෂාභියෝගයට ලක්කර සිටී නම් මිස, සුළු හිමිකම් අධිකරණය වෙත භාර දී ඇති හෝ මේ පනතේ විධිවිධාන යටතේ අනාවරණය කර ගනු ලබන යම් ලේඛනයක් ඉදිරිපත් කර ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

(2) සුළු හිමිකම් අධිකරණය විසින්, ලේඛනය ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවීමෙන් පසුව, එම ලේඛනය පිළිගනු ලබන අවස්ථාවක දී, එම ලේඛනය නොපිළිගත් පාර්ශ්වය විසින් බදු ගාස්තුවලට අමතරව එම ලේඛනය ඔප්පු කිරීමේ දී දරන ලද පිරිවැය ගෙවීමට ද යටත් විය යුතු ය.

**නඩු තීන්දුව සහ තීන්දු ප්‍රකාශය**

**26.** සිවිල් නඩු විධාන සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට සුළු හිමිකම් අධිකරණයේ නඩු තීන්දුව හෝ තීන්දු ප්‍රකාශය, ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම**

**27.** යම් සුළු හිමිකම් අධිකරණයක සියලු නඩු කටයුතු ඒ හා සම්බන්ධයෙන් අදාළ වන නීතිය ප්‍රකාරව හැකි පහසු ඉක්මනින් අවසන් කරනු ලැබිය යුතු අතර විනිශ්චයකාරවරයා විසින් හේතු වාර්තා කරන ආකාරයට ඒ අනුව ක්‍රියා කිරීමෙන් විනිශ්චයකාරවරයා වළක්වා ඇත්නම් මිස, එම නඩු කටයුතු ආරම්භ කිරීමේ දිනයේ සිට මාස දහඅටක කාලසීමාවක් ඇතුළත එම නඩු කටයුතු අවසන් කිරීම සඳහා සුළු හිමිකම් අධිකරණය විසින් සෑම උත්සාහයක්ම දරනු ලැබිය යුතු ය.

**පාර්ශ්වකරුවන්ගේ පැහැර හැරීම**

**28.** පැහැර හැරීම් මත සිදු කරනු ලබන යම් ආඥාවකට එරෙහිව සිදු කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් හැර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන පාර්ශ්වකරුවන්ගේ පැහැර හැරීම්වල ප්‍රතිවිපාක සම්බන්ධයෙන් සහ එම පැහැර හැරීම් නිවැරදි කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

V වන කොටස

**අභියාචන**

අභියාචන සහ අභියාචන විභාගවෙමින් පැවතිය දී නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම කල් තැබීම

**29.** (1) තමා පාර්ශ්වයක් වන යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කරුණක දී සුළු හිමිකම් අධිකරණයේ නඩු තීන්දුවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් කරුණුමය වශයෙන් හෝ නීතියෙහිලා වූ යම් වරදක් සම්බන්ධ එවැනි නඩු තීන්දුවකට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තමා පාර්ශ්වයක් වන හෝ පාර්ශ්වයක් වීමට අපේක්ෂා කරනු ලබන යම් නඩු නිමිත්තක්, නඩු කටයුත්තක් හෝ කරුණක් සම්බන්ධයෙන් යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් පැහැර හැරීමක් සම්බන්ධයෙන් වාර්තාගත කරන ලද නඩු තීන්දුවක් අවලංගු කරනු ලබන හෝ අවලංගු කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන ආඥාවක් ඇතුළු යම් ආඥාවකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන කරුණුමය හෝ නීතියෙහිලා වූ වරදක් නිවැරදි කිරීම සඳහා එම ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචන සම්බන්ධයෙන් වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන, LIX වන, LX වන සහ LXI වන පරිච්ඡේදවල සඳහන් විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට සුළු හිමිකම් අධිකරණවලින් වන අභියාචන සඳහා අදාළ විය යුතු ය.

(4) විනිශ්චයකාරවරයා එසේ ක්‍රියා කිරීමෙන් වළක්වා ඇත්නම් මිස සහ ඔහු විසින් තත් කාර්ය සඳහා හේතු වාර්තා කර ඇත්නම් මිස, මේ පනත යටතේ වූ අභියාචනය සඳහා හෝ අවසාන අභියාචනය සඳහා අවසර ලබා දීමේ ඉල්ලීමක්, එසේ එම ඉල්ලීම හෝ අභියාචනය ඉදිරිපත් කිරීමේ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් ඇතුළත විභාග කර අවසන් කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

නඩු කටයුතු සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනත අදාළ වීම

**30.** (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන සුළු හිමිකම් අධිකරණය ඉදිරියේ විභාග වන නඩු කටයුතු සඳහා අදාළ විය යුතු ය.

අත්හැරුණ කරුණු

**31.** (1) මේ පනතේ කිසිදු විධිවිධානයක් සලසා නොමැති යම් කරුණක් උපචිත වන අවස්ථාවක දී, එවැනි කරුණක් පාලනය කරනු ලබන සිවිල් නඩු විධාන සංග්‍රහයේ සඳහන් විධිවිධාන, සාධාරණත්වය අනුව අවශ්‍ය වන යෝග්‍ය වෙනස්කම් සහිතව, එම විධිවිධාන මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවේ නම්, ඒ අනුව යොදාගෙන අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) කාර්ය පටිපාටියේ යම් තාක්ෂණික දෝෂ පැවතීම හෝ උත්තරවාද, දිවුරුම් ප්‍රකාශ හෝ ආකෘතිවල සාමාන්‍ය දෝෂයක් හෝ නොගැළපීමක් පැවතීම නිසා සුළු හිමිකම් අධිකරණයක කිසිදු නඩු කටයුත්තක් අවලංගු නොවිය යුතු අතර සුළු හිමිකම් අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ස්වකීය අභිමතය පරිදි සහ යුක්තියෙහි යහපත උදෙසා, එම දෝෂ හෝ නොගැළපීම් මගින් පාර්ශ්වකරුවන් වෙත යුක්තිය ඉටු නොවීමක් හෝ සැලකිය යුතු අගතියක් සිදු වී ඇත්නම් මිස, එම තාක්ෂණික දෝෂ මගින් යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් බාධාවක් නොවන බවට සහතික විය යුතු ය.

විශේෂ නිල ලැයිස්තුව

**32.** මේ පනත යටතේ සුළු හිමිකම් අධිකරණයේ විනිශ්චයකාරවරයා වශයෙන් දිසා විනිශ්චයකාරවරයා ක්‍රියා කරනු ලබන අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන යටතේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් විශේෂ නිල ලැයිස්තුවක් පවත්වා ගත යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන

**33.** සුළු හිමිකම් අධිකරණයක අධිකරණ බලසීමාව තුළට ගැනෙන යම් කරුණක් සම්බන්ධයෙන්, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී පූර්ව නඩු විභාගය ආරම්භ කිරීමට පෙර පවතින යම් අධිකරණ දිසාවක දිසා අධිකරණයක විභාගවෙමින් පවතින සියලු නඩු කටයුතු, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී උචිත සුළු හිමිකම් අධිකරණය වෙත පැවරී පැවතිය යුතු අතර එවැනි දිසා අධිකරණයක පනවනු ලැබූ නඩුවේ එම සමාන කාර්ය පටිපාටිය ප්‍රකාරවම එම නඩුව සංජානනය කිරීම, විභාග කිරීම සහ

තීරණය කිරීම හෝ අඛණ්ඩව පවත්වාගෙන යෑම හෝ සම්පූර්ණ කිරීම සඳහා සුළු හිමිකම් අධිකරණය වෙත අධිකරණ බලය තිබිය යුතු අතර එවැනි දිසා අධිකරණයක් ඉදිරියේ පැවැති එවැනි සෑම නඩුවක් සම්බන්ධයෙන් ලබා දෙන සෑම ආඥාවක් ම එම සුළු හිමිකම් අධිකරණය විසින් ලබාදුන් ලෙස සලකමින් ඒ සඳහා ඒ හා සමාන බලයක් සහ බලපෑමක් තිබිය යුතු ය.

අර්ථ නිරූපණය

**34.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස-

"සිවිල් නඩු විධාන සංග්‍රහය" යන්නෙන්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය අදහස් වේ;

"අධිකරණ සංවිධාන පනත" යන්නෙන්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ අධිකරණ විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා අදහස් වේ;

"සුළු හිමිකම්" යන්නෙන්, අධිකරණ සංවිධාන පනතේ 29අ වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව නිශ්චිතව දක්වා ඇති මුදල නොඉක්මවන හෝ කලින් කල අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් මුදලක් වන්නා වූ අධිකරණ සංවිධාන පනතේ හත්වන උපලේඛනයේ සඳහන් යම් ණය මුදලක්, වන්දි මුදලක් හෝ ඉල්ලා සිටීමේ මුදලක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය**

[8(1) වන වගන්තිය]

1 වන ආකෘතිය

**පැමිණිල්ල**

**...........................................**සුළු හිමිකම් අධිකරණයේ දී ය.

නඩු අංකයඃ-
පැමිණිල්ලේ දිනය ඃ-
හිමිකමේ ස්වභාවයඃ-

පැමිණිලිකරුගේ (පැමිණිලිකරුවන්ගේ) නම (නම්)ඃ-.......................
ලිපිනය (ලිපිනයන්) ඃ- ...........................................................................
දුරකතන අංකය ඃ- ....................................................................................
විද්‍යුත් ලිපිනය (පවතී නම්) ඃ- .......................................................................

එරෙහිව

විත්තිකරුගේ (විත්තිකරුවන්ගේ) නම (නම්) ඃ- ....................................
ලිපිනය (ලිපිනයන්) ඃ- ...........................................................................
දුරකතන අංකය ඃ- ....................................................................................
විද්‍යුත් ලිපිනය (දැන සිටී නම්) ඃ- ................................................................

...........................................................................................................................................
...........................................................

නීතීඥ ..........................................මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් පැමිණිලිකරුගේ (පැමිණිලිකරුවන්ගේ) පැමිණිල්ලේ මෙසේ සඳහන් වේඃ-
...........................................................................................................................................

නඩු නිමිත්ත හටගත් ස්ථානය, ආකාරය සහ එය හටගත් දිනය ඇතුළු එක් එක් නඩු නිමිත්ත සංයුක්ත කරනු ලබන අවස්ථානුගත කරුණු පිළිබඳ කෙටි ප්‍රකාශයක් ඃ-

1. ...........................................................................................................................

2. ...........................................................................................................................

හිමිකමේ වටිනාකම (පොලිය නොමැතිව) ඃ- ..........................................................
පොලිය (ඉල්ලා ඇත්නම්) ඃ- .......................................................................
සමස්ත හිමිකමේ වටිනාකම ඃ- .................................................................

(සමස්ත හිමිකම්පෑම (පොලිය නොමැතිව දැනට රු. .................................... වූ) ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති මුදල ඉක්මවන අවස්ථාවක දී, නඩුව, සුළු හිමිකම් අධිකරණයේ අධිකරණ බලය තුළට ගෙන ඒම සඳහා තමා විසින් සමස්ත හිමිකම (පොලිය නොමැතිව)

...................................................... දක්වා සීමා කරනු ලබන බවට පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සඳහන් කරනු ලැබිය හැකි ය.)
...................................................................................................

ඉල්ලීම.
................................................................................................................................................

.........................................................
පැමිණිලිකරුගේ/ පැමිණිලිකරුවන්ගේ අත්සන/අත්සන් නැතහොත්

...........................................
(පැමිණිලිකරුගේ/පැමිණිලිකරුවන්ගේ නීතිඥවරයාගේ) අත්සන

2 වන ආකෘතිය

[10(2) වන වගන්තිය]

**සුළු හිමිකම් අධිකරණවල විශේෂ කාර්ය පටිපාටිය පිළිබඳ නඩුවක දී සිතාසි භාරදීම සම්බන්ධයෙන් වූ සිතාසි ආකෘති පත්‍රය**

ඉහත නම් සඳහන් විත්තිකරු (හෝ විත්තිකරුවන්) වෙතටයි.

පැමිණිලිකරු වෙත අයවිය යුතු (හිමිකම පිළිබඳ විස්තර සඳහන් කරන්න) .................................................................. අනුපාතිකයන් යටතේ වූ පොලිය සමඟ රු. ................................ වූ මුදලක් අයකර ගැනීම සඳහා ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් ඔබට එරෙහිව 2022 අංක දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනතේ විධිවිධාන යටතේ මේ සුළු හිමිකම් අධිකරණයේ නඩුවක් පවරා ඇති හෙයින්, 20 .............................................. මස ............................ දින ප.ව. 9.00 වන විට හෝ එයට පෙර ඔබගේ විත්තිවාචකය තහවුරු කිරීමට දිවුරුම් පෙත්සමක් හෝ දිවුරුම් පෙත්සම් ද, ඔබගේ සන්තකයේ සහ බලය යටතේ පවතින වෙනත් ලේඛනවල පිටපත් ද සමඟින් සුළු හිමිකම් අධිකරණයේ ඔබගේ උත්තරය ගොනු කරන ලෙස ඔබට මෙයින් නියම කරනු ලබන අතර, එකී දිනයේ දී හෝ එම දිනයට පෙරාතුව ලේඛන ද සමඟින් උත්තරය සහ දිවුරුම් පෙත්සම ගොනු කිරීම ඔබ විසින් පැහැර හැරිය හොත්, නඩුව ඉදිරියට ගෙන ගොස් ඒක පාර්ශ්විකව විභාග කරනු ලබන බවට ඔබට මෙයින් දැනුම් දී සිටිනු ලැබේ.

ඔබ ලියාපදිංචි නීතිඥයකු මගින් පෙනී නොසිටී නම්, සියලු නෛතික නිවේදන භාරදිය යුතු ලිපිනයක් ප්‍රකාශ කරමින් පත්‍රිකාවක් ගොනු කරන ලෙස ඔබට තවදුරටත් නියම කර සිටිනු ලැබේ.

මේ සමග අමුණා ඇති ලේඛනඃ-

පැමිණිල්ලේ පිටපතක්ඃ-
දිවුරුම් ප්‍රකාශයේ/ දිවුරුම් ප්‍රකාශවල පිටපත්ඃ-
පහත දැක්වෙන ලේඛනවල පිටපත්ඃ-

1.......................................................................................................................................

2.......................................................................................................................................

සුළු හිමිකම් අධිකරණයේ (අත්සන)
............................ රෙජිස්ට්‍රාර්වරයාගේ නියමය පරිදි.
20 .................. වූ ................. මස .................. දින දී ය.

3 වන ආකෘතිය

[12(2) වන වගන්තිය]

**උත්තරය**

**..............................................සුළු හිමිකම් අධිකරණයේ දී ය.**

නඩු අංකයः-
පැමිණිල්ලේ දිනය ः-
හිමිකමේ ස්වභාවයः-

පැමිණිලිකරුගේ (පැමිණිලිකරුවන්ගේ) නම (නම්)ः- .......................
ලිපිනය (ලිපිනයන්) ः- .....................................................................
දුරකතන අංකය ः- ...........................................................................
විද්‍යුත් ලිපිනය (ඇත්නම්) ः- ..........................................................

එරෙහිව

විත්තිකරුගේ (විත්තිකරුවන්ගේ) නම (නම්) ः- ...................................
ලිපිනය (ලිපිනයන්) ः- .....................................................................
දුරකතන අංකය ः- ...........................................................................
විද්‍යුත් ලිපිනය (දැන සිටි නම්) ः- ..................................................

නීතිඥ ..........................................මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් විත්තිකරුගේ (නැතහොත් විත්තිකරුවන්ගේ) උත්තරයේ මෙසේ සඳහන් වේः-

පැමිණිල්ලේ ඇතැම් සම් ප්‍රකාශ පිළිගනිමින් හෝ ප්‍රතික්ෂේප කරමින්, විත්තිකරු විසින් ස්වකීය විත්තිවාචකය මත රඳා පවතින ආකාරය පිළිබඳව කරුණු සහ නීතිමය කරුණු මෙන්ම නඩුවේ අවස්ථානුගත කරුණු සවිස්තරාත්මකව පැහැදිලිව සහ සංක්ෂිප්ත ලෙස ප්‍රකාශ කරනු ලබන ලුහුඬු ප්‍රකාශයක්ः-

1.......................................................................................................................................

2.......................................................................................................................................

සුළු හිමිකම් අධිකරණයේ අධිකරණ බලය තුළට ගැනෙන හරස් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට විත්තිකරු සූදානම් වේ නම්, විත්තිකරු විසින් එම හරස් ඉල්ලීම ඉදිරිපත් කිරීමේ හේතු සංයුක්ත වන කරුණු පිළිබඳ පැහැදිලි සහ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.

1.......................................................................................................................................

2.......................................................................................................................................

විත්තිකරු විසින් හිමිකම්පෑම මේ සුළු හිමිකම් අධිකරණයේ අධිකරණ බලය යටතට ගෙන ඒමේ අරමුණින් යුතුව ස්වකීය ප්‍රතිහිමිකම් පෑමෙන් කොටසක් අත්හැරීමට තීරණය කර ඇති අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති මුදල (පොලිය හැර) දක්වා අත්හරින ලද මුදල සහ ප්‍රතිහිමිකම් පෑම සඳහා සීමාකළ මුදල නිශ්චිතව දක්වනු ලබන ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.

ප්‍රතිහිමිකම්පෑමේ වටිනාකම
(පොලිය නොමැතිව)ඃ- ......................................................................................................

පොලිය (ඉල්ලා ඇත්නම්)ඃ- ..............................................................................................

ඉල්ලීමඃ-
.......................................................................

විත්තිකරුගේ/විත්තිකරුවන්ගේ අත්සන/ අත්සන් නැතහොත්

..............................................................................
(විත්තිකරුගේ/විත්තිකරුවන්ගේනීතීඥවරයාගේ) අත්සන

මේ සමග අමුණා ඇති ලේඛනඃ-

දිවුරුම් ප්‍රකාශයේ/දිවුරුම් ප්‍රකාශවල
පිටපත්ඃ

පහත දැක්වෙන ලේඛනවල
පිටපත්ඃ-

1.

2.